# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 243/32 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින.
ජනාධිපති කාර්යාලය,
කොළඹ.

**නියෝග**

1. මෙම නියෝග හදිසි අවස්ථා (වැවිලි කර්මාන්තයේ කම්කරුවන්ගේ අතිරේක විශේෂ දීමනා) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝගවල කාර්යයන් සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා විය යුතු ය.

(2) මෙම නියෝගවලින් නියම බලධරයා වෙත පැවරුණු හෝ නියම කෙරුණු යම් බලයක්, කාර්යයක් හෝ යුතුකමක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ඔහු විසින් පැවරිය හැකි ය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මෙම නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතුය. තවද, ඒ අනුව, මෙ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවක ඒ නොගැලපීමේ ප්‍රමාණයට ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

4. (1) තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තයෙහි හෝ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තයෙහි හෝ පොල් වැවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවකුගේ සෑම සේවායෝජකයකුම විසින් මෙම නියෝගවල උපලේඛනයෙහි විධිවිධාන සලස්වා ඇති මෙහි මින් මතු " අතිරේක විශේෂ දීමනාවක් " යනුවෙන් සඳහන් කරනු ලබන දීමනාවක් 1972 නොවැම්බර් මස 1 වන දින සිට ඒ කම්කරුවාට ගෙවිය යුතු ය.

(2) මෙම නියෝග යටතේ ගෙවිය යුතු අතිරේක විශේෂ දීමනාව පඩි පාලක සභා ආඥාපනතේ 20 (2) (අ) (ii) වන වගන්තිය යටතේ තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය හෝ රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය හෝ පොල් වැවීමේ කර්මාන්තය සඳහා වූ පඩි පාලක සභාව විසින් කරනු ලැබූ තීරණ කිසිවක් යටතේ ගෙවිය යුතු විශේෂ දීමනාවකට අතිරේකව විය යුතු ය.

5. 4 වන නියෝගයෙහි නිශ්චිතව සඳහන් යම් කර්මාන්තයක නියුක්ත යම් කම්කරුවකුට මෙම නියෝග යටතේ ගෙවිය යුතු අතිරේක විශේෂ දීමනාව ගෙවීම පඩි පාලක සභා ආඥාපනත යටතේ ඒ කර්මාන්තය සඳහා වූ පඩි පාලක සභාව විසින් කරනු ලැබූ තීරණයක් වශයෙන් සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතෙහි විධිවිධාන පඩි පාලකසභාවක වෙනත් යම් තීරණවලට අදාළ වන ආකාරයෙන්ම ඒ ගෙවීමට හා ඒ ගෙවීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

6. 4 වන නියෝගයෙහි සඳහන් කර්මාන්ත තුන අතුරෙන් යම් කර්මාන්තයක 1972 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි සෑම කම්කරුවකුම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩවා සේවයෙහි යොදවනු ලැබ සිටින තාක් කල්, 1972 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි ඔහු භුක්ති විඳිමින් සිටි, අතිරේක විශේෂ දීමනාව හැර වැටුප්, දීමනා හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් වුව ද හඳුන්වනු ලබන මුදලෙන් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියමයන්ට හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියමයන් හා කොන්දේසි පිට ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි යොදවනු ලැබිය යුතු ය.

75A——ඒ 24323—2,100 (76/12)

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝගවල—

(අ) " කොමසාරිස් ", " කම්කරුවා ", " සේවායෝජකයා ", " වේතන " සහ " කර්මාන්තය " යන යෙදුම්වලට (136 වන අධිකාරය වූ) පඩි පාලක සභා ආඥපනතෙහි දී ඇති අර්ථම පිළිවෙලින් විය යුතු ය ;

(ආ) " තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තය ", " රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තය " සහ " පොල් වැවීමේ කර්මාන්තය " යන මේවාට ඒ කර්මාන්ත සම්බන්ධයෙන් (136 වන අධිකාරය වූ) පඩි පාලක සභා ආඥපනතෙහි 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ ආඥාවෙහි දී ඇති අර්ථම පිළිවෙලින් විය යුතු ය.

(ඇ) " ළමා කම්කරුවා " යන්නෙන් වයස අවුරුදු 16 ට අඩු පිරිමි කම්කරුවෙක් හෝ වයස අවුරුදු 15ට අඩු කම්කරු ස්ත්‍රියක් අදහස් වේ.

## උපලේඛනය

මෙහි පහත I වන තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවකුට මෙම නියෝග යටතේ ගෙවිය යුතු අතිරේක විශේෂ දීමනාව මෙහි පහත II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව විය යුතුය :—

| I වන තීරය<br>කම්කරුවාගේ පන්තිය | II වන තීරය<br>වැඩ කරන සාමාන්‍ය දිනයක් සඳහා අතිරේක විශේෂ දීමනාව |
|---|---|
| වයස අවුරුදු 16 ට නොඅඩු පිරිමි කම්කරුවකුට ... ... | ශත 18 යි. |
| වයස අවුරුදු 15 ට නොඅඩු කම්කරු ස්ත්‍රියකට ... ... | ශත 12 යි. |
| ළමා කම්කරුවකුට ... ... ... | ශත 12 යි. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.